# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2113/8 - 2019 මාර්තු මස 05 වැනි අඟහරුවාදා - 2019.03.05**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 03/2019 දරන සුරාබදු නිවේදනය

**දේශීය නිෂ්පාදිත වයින් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 මාර්තු මස 06 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ;

(1) මධ්‍යසාර ප්‍රතිශතය 18% ට අඩු දේශීය ශාක ද්‍රව්‍ය හෝ ශාක නිෂ්පාදන හෝ දේශීය පානීය සත්ත්ව කිරි මගින් ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් සඳහා මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හයසියයක් (රු. 600.00) වන බද්දක් අයවිය යුතු යැයි ද, ඉහත සඳහන් මත්පැන් දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද ඒ සඳහා වූ සුරාබද්ද අයනොකළ යුතු ය.

(2) 2011 නොවැම්බර් මස 21 දිනැති අංක 1733/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 946 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

03 - 1071

1A - PG 4416 — 592 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*